# මැතිවරණයට අදාළ කෝවිඩ් සෞඛ්‍ය උපදෙස් නීතියක් බවට පත්කළ යුතුයි - පැෆරල් සංවිධානය

■ එච්.අයි. තුෂාර

'කෝවිඩ් - 19' තත්ත්වය තුළ මැතිවරණය පැවැත්වීමට අදාළව හඳුන්වා දී තිබෙන සෞඛ්‍ය උපදෙස් නීතියක් බවට පත් කළ යුතු බව පැෆරල් සංවිධානය සඳහන් කරයි.

ජන ජීවිතය සුරක්ෂිත කරගැනීමේ අරමුණින් මැතිවරණය පැවැත්වීමට අදාළ සෞඛ්‍ය මාර්ගෝපදේශ මේ වන විට හඳුන්වා දී තිබෙන බවත්, ඒ පිළිබඳව දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කර මෙම උපදෙස් නීතියක් බවට පත්කළ යුතු බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කළේය.

උපදෙස් වශයෙන් ලබාදෙන දේවල් ජනතාවට ක්‍රියාත්මක කළ හැකි සේම ක්‍රියාත්මක නොකර සිටීමටත් හැකියාව තිබෙන බවත්, එහෙත් නිරෝධායනය හා රෝග වැළැක්වීමේ පනතට අනුව අදාළ උපදෙස් ගැසට් කළහොත් එය දේශපාලනඥයන් හා ජනතාව අනිවාර්යයෙන්ම පිළිපැදිය යුතු බවද පවසා සිටියේය.

මේ නිසා අදාළ සෞඛ්‍ය උපදෙස් දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කර, ක්‍රියාත්මක කළ හැකි සෞඛ්‍ය උපදෙස් ගැසට් කිරීමට අදාළ කටයුතු කරන ලෙසට මැතිවරණ කොමිෂන් සභාවෙන් ඊයේ (15දා) ලිඛිතව ඉල්ලා සිටි බවත්, ඇතැම් සෞඛ්‍ය උපදෙස් ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ගැටලු ඇතිවිය හැකි නිසා මේ පිළිබඳව දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කළ යුතු බවද හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් කියා සිටියේය.